**2015 නොවැම්බර් 23  කොළඹ දී ශ්‍රී ලාංකික තරුණ තරුණියන් සමග පැවති සාකච්ඡාවේදී**

**එක්සත් ජාතීන්ගේ සංවිධානයේ  එක්සත් ජනපදයේ නිත්‍ය නියෝජිතවරිය වන තානාපතිනි සමන්තා පවර් දැක්වූ අදහස්**

**තානාපතිනි පවර්:** මෙහි පැමිණීම ගැන ඔබ සියලු දෙනාට ම ඉතාම ස්තුතියි. දරීෂා ඔබටත් ස්තුතියි. අපි හැම දෙනා ම දන්නා පරිදි දරීෂා  ඉතා විශිෂ්ට මාධ්‍යවේදිනියක්. ඇගේ කටයුතුවල වඩා ම සිත් කා වදින ලක්ෂණය වන්නේ වෙනත් බොහෝ අය වාර්තා කිරීමට නො යන  දේ ගැන ලිවීමෙන් ඇය ගන්නා අවදානමයි. මේවා අතර දූෂණය, අධිකරණයේ ස්වාධීනත්වය නැති වීම හා ගිය අවුරුද්දේ අළුත්ගම ඇතිවූ ජාතිවාදී කෝලාහලය ආදිය වෙයි. අද මෙම සාකච්ඡාව  මෙහෙයවීම ගැන මෙන් ම  ඔබේ සහෝදර ශ්‍රී ලාංකිකයන්ට  ඔබ ලබා දෙන අත්‍යවශ්‍ය සේවය ගැනත් ඔබට බෙහෙවින් ම ස්තුතියි.

ආපසු වරක් ශ්‍රී ලංකාවට පැමිණීමට ලැබීම කොතරම් වැදගත් ද යන්න මට කිව නොහැකියි. ඔබේ විස්මයජනක රටේ  ගත කරන දින තුන ඇතුළත  හැකි තරම් දේශපාලන හා හමුදා නායකයන්, සිවිල් සමාජ කණ්ඩායම්, මානව හිමිකම් ආරක්ෂකයන්, දරීෂා වැනි නිර්භීත මාධ්‍යවේදීන් හමු වීමට මම බලාපොරොත්තු වෙමි. යාපනේ ඔස්මානියා විද්‍යාලයේ ගැහැනු දරුවන් සමග  මා පළමු වරට එල්ලේ ක්‍රීඩා කරනු ඔබ සමහරෙක් දකින්නට ඇත. නමුත් ඔබ නො දන්නා, මගේ විස්තෘත ජීව දත්තවල පවා අඩංගු නොවන, කරුණක් නම් මාධ්‍යවේදියෙක් හෝ රාජ්‍ය තාන්ත්‍රිකයෙක් වීමට බොහෝ කලකට පෙර  මම සිහින දුටුවේ වෘත්තීය බේස්බෝල් ක්‍රීඩිකාවක් වීමට බවයි. (සිනා) ඊයේ පළමු වරට පිත්තෙන් පහර දුන් අවස්ථාවේ මට සිතුණේ මම ඒ මග තෝරා ගත්තා නම් මගේ දෛවය බොහෝ වෙනස් වන්නට තිබූ බවයි. (සිනා) එම ගැහැනු දරුවන් සමග එක්වීමට ලැබීම ඉතා චමත්කාරී අත්දැකීමක් වන අතර  ශ්‍රී ලංකාවේ පුවත්පත්වල පළමු ඡායාරූපවල හොඳම කොටස වන්නේ  මා දවා ගැනීමට මා දෙසට පන්දුව එවන දරුවන්ගේ මුහුණුයි.

2010 වර්ෂයේ මා ඔබේ රටට පැමිණි අවස්ථාවේ තිබුණු තත්වයට වඩා බොහෝ දේ වෙනස් වී තිබේ. ශ්‍රී ලංකාවේ ජනතාවෙන් බහුතරයක්  මේ අවුරුද්දේ දෙවරක් ම වඩා ප්‍රජාතන්ත්‍රවාදී හා වගකියන රජයකට ඇති කැමැත්ත ප්‍රකාශ කර තිබේ. බෙදීම වෙනුවට ප්‍රතිසන්ධානයේ මග ඔබ දෙවරක්ම තෝරා ගෙන තිබේ.  මෙම

ක්‍රියාකාරකම් පරිපූර්ණ නොවූවත් දැන් බොහෝ දෑ සිදු වෙමින් පවතී. මෙම ක්‍රියාවලිය හරියාකාර සිදු වන බව සහතික කිරීමට ශ්‍රී ලංකාවේ කරුණ තරුණියන් හැටියට ඔබට කළ හැකි දේවල් තුනක් ගැන මම අද කථා කිරීමට අදහස් කරමි. මේවා අතීතයේ තුවාල සුව කර ගැනීමට මෙන් ම අන් සියලු රටවල මෙන් මේ රටේ අනාගතයටත්, තීරණාත්මක වන මූලික නිදහස ස්ථාපිත කර ගැනීමටත් ඉවහල් වනු ඇත.

පළමුවෙන්ම මට අවශ්‍ය වන්නේ ඔබේ රටේ අනාගතය හැඩ ගස්වා ගැනීමට ඔබට ඇති අයිතිය දිගටම ප්‍රයෝජනයට ගන්නා ලෙස ඔබ දිරිගැන්වීමටයි. ප්‍රබල ප්‍රජාතන්ත්‍රවාදයක් , වැඩි සහභාගීත්වයක් හා මානව හිමිකම්වලට ගෞරවයක් වැනි කරුණු වෙනුවෙන් පෙනී සිටින රජයක් ඔබ වැනි තරුණ තරුණියන් ඇතුළු ශ්‍රී සියලූ ලාංකිකයන් විසින් තෝරා ගෙන තිබේ. බෙදීම් වෙනුවට ප්‍රතිසන්ධානයේත්, බිය වෙනුවට අපේක්ෂාවේත් මග ඔබ සාමූහිකව තෝරා ගෙන ඇත. නමුත් ශ්‍රී ලාංකිකයන්ගේ කාර්යභාරය ඡන්ද පෙට්ටියෙන් අවසන් නොවේ. ඔබේ රජය දී ඇති පොරොන්දු අනුව කටයුතු කරන ලෙස ඔබ හඬ නැගිය යුතුය. ඒ මන්ද යත් ශ්‍රී ලංකාවේ අනාගතය වඩාත් ම වැදගත් වන්නේ ඔබට බැවිනි.

මෙහිදි මට අපේ ශ්‍රේෂ්ඨ ජනාධිපති ඔබාමා ගෙන හැර දක්වා ඇති ඇමරිකානු ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චය කරුවෙකු වූ ලුවී බැන්ඩීස්ගේ කියමනක් වන “ඕනෑම ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක වැදගත්ම තනතුර වන්නේ පුරවැසියාගේ තනතුරයි“ යන්න සිහිවේ. මා සිතන්නේ ඔබේ රටේ සිදුවන්නේත් එයයි.

මෙහි කොටසක් ලෙස තරුණ කාන්තාවන්ගේ සහභාගීත්වය සලකා බලන්න. මෙහි සිටින අයගෙන් අඩක් ම කාන්තාවන් වීම ඉතා සුබදායක ලකුණක් බව මට සිතේ. ලෝකයේ බොහෝ රටවල ද්විතීයික අධ්‍යාපනය ලබන පිරිමි ළමයින් සංඛ්‍යාව ගැහැනු ළමයින් සංඛ්‍යාවට වඩා වැඩි නමුත් ශ්‍රී ලංකාවේ පිරිමින්ට වඩා ගැහැනු ළමයින් ද්විතීයික අධ්‍යාපනය ලබති. විශ්ව විද්‍යාලවල උපාධි අපේක්ෂකයන්ගෙන් සියයට 60ක්ම ගැහැනු ළමයින් වේ. නමුත් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ කාන්තා ප්‍රතිශතය කුමක් ද?

ඔව්, ඉදිරි පෙළ සිටින කෙනෙක් එය දන්නවා. සියයට පහයි. 1947 ශ්‍රී ලංකාවේ ප්‍රථම පාර්ලිමේන්තුව පත්වූ අවස්ථාවේ එහි සියයට තුනක් කාන්තාවන් සිටියහ. ඒ

1947 දීයි. මේ 2015 වර්ෂයයි. මේ කාලය තුළ එය සියයට තුනේ සිට වැඩිවී ඇත්තේ සියයට පහක් දක්වා පමණි. මෙය එතරම් ලොකු දියුණුවක් නොවේ.

ලෝකයේ වෙනත් බොහෝ රටවල ද තත්වය එතරම් සතුටුදායක තත්වයක නැත. උදාහරණයක් වශයෙන් එක්සත් ජනපදයේ කොංග්‍රෙසයේ සාමාජිකයන් අතර කාන්තාවන් ඇත්තේ සියයට 20 ක් පමණි. මම එක්සත් ජනපදයේ නිත්‍ය නියෝජිතයා ලෙස කටයුතු කරන එක්සත් ජාතීන්ගේ සංවිධානයේ රටවල් 193න් කාන්තා නියෝජිතයන් එවා ඇත්තේ රටවල් 37ක් පමණි. මෙය දළ වශයෙන් එක්සත් ජනපද කොංග්‍රෙස් මණ්ඩලයේ කාන්තා ප්‍රතිශතයම වෙයි. එනම් සියයට 20 ක් පමණයි.

කාන්තා නායකත්වය පිළිබඳ ඉතා සාඩම්බර සම්ප්‍රදායක් ඇති ඔබේ රටේ එය කාන්තා නියෝජනයක් බවට පරිවර්තනය කර ගත යුතුය. මේ 1960 දී රාජ්‍ය නායිකාව ලෙස කාන්තාවක් පත් කර ගත් පළමු රටයි. එක්සත් ජනපදයට තවමත් එවැන්නක් කිරීමට හැකිවී නැත. (සිනා) දශක ගණනාවකට පෙර කාන්තාවන්ට ඡන්ද අයිතිය ලැබුණු ආසියාවේ පළමු රට ද ශ්‍රී ලංකාවයි. 1928 දී කාන්තාවන්ට ඡන්ද අයිතිය ලබා දීම ගැන වාද විවාද සිදු වන කාලයේ මෙම ව්‍යාපාරයේ එක් නායිකාවක් වූ ඇග්නස් ද සිල්වා නම් කාන්තාවගෙන් තිල සාකච්ඡාවකදී දෙමළ වතු කම්කරු ගැහැනුන්ටත් ඡන්ද අයිතිය ලබා දිය යුතු දැයි අසා තිබේ. ඇය දුන් පිළිතුර ද සිල්වා පසුව ලියා තිබේ. "මා කීවේ ගැහැනු දෙමළ වතු කම්කරුවන්ද කාන්තාවන් වන බවයි. අපට අවශ්‍ය සෑම කාන්තාවකටම ඡන්ද අයිතිය ලබා දීමටයි"

කාන්තාවන් නායකත්ව තනතුරුවල සිටීම නිසැකයෙන්ම වටිනා දෙයක් වනවා පමණක් නොව ඔබේ රටේ අනාගතයට එය තීරණාත්මක වශයෙන් වැදගත් වේ. වඩා උගත්, සෞඛ්‍ය සම්පන්න හා සමාජීය කටයුතුවලට සහභාගි වන කාන්තාවන් සිටින රටවල්, වඩා ස්ථායි, වඩා සාමකාමී හා වඩා සමෘද්ධිමත් රටවල් බව බොහෝ අධ්‍යයනයන්ගෙන් පෙන්වා දී ඇත. මේ අනුව මේ කාමරයේ සිටින කාන්තාවන් දෙස බලන විට මිනිසුන් 5600ක් පමණ තරග කළ අගෝස්තු පාර්ලිමේන්තු මැතිවරණයට ඉදිරිපත් වූයේ කාන්තාවන් 550ක් පමණක් වීම මට ප්‍රහේලිකාවකි. ඒ අනුව තරග කළ සෑම කාන්තාවක්ම වෙනුවට පිරිමින් 10 දෙනෙක් තරග කර තිබේ.

මේ කාමරයේ සිටින කාන්තාවන්ට මෙසේ කියන්නට මම කැමතියි. ඔබ වැඩි දෙනෙක් රාජ්‍ය තනතුරුවල සිටිය හොත් ඔබේ ප්‍රජාවන්ට හා ඔබේ ජාතියට වැඩි

සේවයක් සැලසෙනු ඇත. මේ නිසා ළඟදීම මෙම තනතුරු සඳහා තරග කිරීමට ඔබ කිපදෙනෙක්වත් සැලකිල්ල යොමු කරනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

ඔබ වැනි තරුණ තරුණියන්ට ඔබේ රට හැඩගැස්වීමට ආධාර කළ හැකි ක්‍රම ගණනාවක් තිබේ. දරිෂා විසින් සඳහන් කළ පරිදි මා මෙය ඉගෙන ගත්තේ පළමුවෙන්ම මාධ්‍යවේදිනියක්, ඊළඟට ශාස්ත්‍රඥයෙක් හා ක්‍රියාකාරිනියක් ලෙස දේශපාලනයට ඇතුළු වී අවසානයේ මගේ වර්තමාන රැකියාව වන එක්සත් ජනපදය නියෝජනය කරන රාජ්‍යතාන්ත්‍රිකයෙක් බවට පත් වීමෙනි. මගේ ජීවන වෘත්තියේ තවත් පියවරක් තිබේ. මා හිතන්නේ වෘත්තිය එල්ලේ ක්‍රීඩිකාවක් වීමට මට තවම ඉඩ ඇති බවයි. (සිනා)

ඊයේ යාපනේදී මට සිතා ගත නොහැකි තරම් හද කම්පා කරවන තත්වයේ පසුවන කාන්තාවන් හමුවීමට ඉඩ ලැබුණි. සියලු දුක් වේදනා මැද්දේ ඔවුන්ගේ පවුල් හා ප්‍රජාවන්ට නායකත්වය දෙන කාන්තාවන්, ඔවුන්ගේ ස්වාමි පුරුෂයන් හෝ දරුවන් මරා දමනු ලැබූ හෝ අතුරුදහන් කරවනු ලැබූවත් ඔවුන් සෙවීම අත් නොහරින කාන්තාවන්, අවතැන් කරනු ලැබූවත් ඔවුන්ගේ ඉඩම් ආපසු ලබාගැනීමට සටන් කරන කාන්තාවන්, ලිංගික ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූවත් අපරාධකරුවන්ගේ තර්ජන හා ඔවුන්ගේම ප්‍රජාවේ අපකීර්තිය මැද, යුක්තිය ඉල්ලා සිටීමට තරම් නිර්භීත කාන්තාවන් මා හමුවූ අය අතර විය.

උතුරු පළාතේ පමණක් කාන්තාවන් ප්‍රධානියා වන නිවෙස් 60,000ක් පමණ ඇතැයි ඇස්තමේන්තු කර තිබේ. රටේ වෙනත් ප්‍රදේශවල සිටින තවත් බොහෝ කාන්තාවන් ද ඉතා දුෂ්කර තත්වයන්ට මුහුණ දෙති. තනිවම මෙම යෝධ බර දරා සිටින මෙම කාන්තාවන් මත මුළු මහත් පරම්පරාවක ම අනාගතය රැඳී තිබේ. මෙම කාන්තාවන් මගේ දෙවැනි නිර්දේශයට හොඳ උදාහරණයකි. එනම් ඔබ විකල්පයන් තෝරා ගැනීමේදී බියට ඉඩ නොදිය යුතු බවයි.

විනාශකාරී සිවිල් යුද්ධ වලින් පීඩාවට පත් ඔබේ වැනි සමාජයන්ට පිහිට වීමට තම වෘත්තීය ජීවිතය කැප කළ සර්ජියෝ වීරා ඩි මෙලෝ නම් ශ්‍රේෂ්ඨ එක්සත් ජාතීන්ගේ රාජ්‍ය තාන්ත්‍රිකයා හැම විටම කියා සිටියේ “බිය නරක උපදේශකයෙක්“ බවයි. ඔහුගේ ජීවිතය අවසන් වූයේ 2003 ඉරාකයේදී මුහුණ පෑ බෝම්බ ප්‍රහාරයකිනි.

ඔබ සියලු දෙනා ම දන්නා පරිදි මෙය ඔබේ රටටත් ඔබේ පරම්පරාවටත් ඉතා බලාපොරොත්තු තැබිය හැකි කාලයකි. මේ කාමරයේ සිටින තරුණයන්ගේ බහුතරයක ම මුළු ජීවිත කාලයම ගත වී ඇත්තේ යුද්ධයක් මැද ය. නමුත් යුද ගිනි ඇවිලුණු රටක් සාමකාමී රටක් බවට පරිවර්තනය වෙන ආකාරය මෑත අවුරුදු වලදී ඔබ දැක තිබේ. විශේෂයෙන්ම ජනවාරි මැතිවරණයෙන් පසුව මෙම ක්‍රියාවලිය තවත් වේගවත් වී ඇත.

පසුගිය සතියේ යෝජනා කළ විධායකයේ බලතල අඩු කිරීමේ සිට කලින් සීමාකර තිබූ මූලික නිදහස ප්‍රතිසංස්ථානය කිරීම, අල්ලා ගත් ඉඩම් ආපසු ලබා දීම ආදිය දක්වා සැලකිය යුතු වෙනස්කම් සිදු වෙමින් පවතී. නමුත් මට වඩා ඔබ දන්නා පරිදි ඔබේ සිත් තුළම මේ ගැන බියක් තිබෙන්නට පුළුවන. වේදනාත්මක අතීතය උවමනාවට වඩා හෑරුවොත් දීප්තිමත් අනාගතයක් කරා යා නො හැකි ය යන අදහස ඔබ තුළ තිබිය හැකියි. එසේ නැත්නම් සමහර අවසරයන් නැවත ලබා දුන්නොත් එය ආරක්ෂාවට ප්‍රශ්නයක් විය හැකියි. එකඟතාවක් ඇති කර ගැනීමට වරදාන ලබා දුන්නොත් සමහර විට ඒවා ඔබට විරුද්ධව යොදා ගැනීමට ඉඩ ඇත යන බිය ද ඔබට තිබෙන්නට පුළුවන.

දශක තුනක තිස්සේ පැවති ගැටුමක් සම්බන්ධයෙන් මෙය තේරුම් ගත හැකි හා සාධාරණ තත්වයකි. එවැනි බිය පහසුවෙන් ඉවත් කළ හැකි නොවේ. ඒවා අපේ ලේවල පමණක් නොව ඩීඑන්ඒ වල පවා රැඳී තිබීමට ඉඩ තිබේ. නමුත් අපට ඒ බියට යටත් වී ජීවත් විය නො හැක. සැකය හා ආරවුල් වලින් සමන්විත විෂම චක්‍රය බිඳ දැමීම වළක්වන බියට අප ඉඩ දිය යුතු නැත.

මෙවැනි භීතිකාවන්ට ගොදුරු වී ඇත්තේ ශ්‍රී ලංකාව පමණක් නොවන බව මම පැහැදිලිව කියා සිටිමි. මගේ රට දෙස බලන්න. අන්ත විනාශකාරී බිය පිළිබඳ හැඟීම් මෑතක සිට අපේ දේශපාලන කතිකාවේ ප්‍රමුඛත්වයක් ගෙන ඇති ආකාරය බලන්න.

පැරිස් ප්‍රහාරයෙන් පසුව බොහෝ නිලධාරීන්- රාජ්‍ය නිලධාරීන්- අපේ ජනතාව තුළ ඇති සරණාගතයන් පිළිබඳ බිය වැඩි කර තිබේ. ඔවුන් කියා සිටින්නේ බෝම්බ ප්‍රහාරවලින් පීඩාවට පත් මිනිසුන්, අතුරුදහන් කිරීම්වලින් දුකට පත් මිනිසුන්, හා ආගමික හිංසනයෙන් පීඩා විඳි මිනිසුන් අප භාර නො ගත යුතු බවයි. මේ සියල්ල ශ්‍රී ලාංකිකයන්ට හුරුපුරුදු අත්දැකීම් ය. අපේ රටට සරණ පතා එන අයට ආගමික

පරීක්ෂාවක් පැවැත්විය යුතු යයි හෝ ආගම මත පදනම් ව මුළු ජනගහණයම සෝදිසියට ලක් කළ යුතු යයි යනුවෙන් ඇමරිකාවේ සමහර මිනිසුන් යෝජනා කර තිබේ. මෙය ඉතා අප්‍රසන්නය. ඉතා හානිකරය. එය, පීඩාවට පත්වූවන්ට සරණ සපයන එක්සත් ජනපදයේ සාඩම්බර හා දීර්ඝකාලීන සම්ප්‍රදාය කෙලසයි.

නමුත් නායකයන්ට, ප්‍රජාවන්ට හා පුද්ගලයන්ට මෙවැනි කරුණුවලට තමන් මෙහෙයවීම වැළැක්විය හැකියි. මගේ තුන්වැනි හා අවසාන කරුණ එයයි. අප බිය වන පුද්ගලයන් දැන හඳුනා ගැනීමට තරම් අප නිර්භීත විය යුතුයි. එසේ කළ විට ඔවුන්ද අපට වඩා වෙනස් නොවන බව පෙනී යනු ඇත. ජනාධිපති ඔබාමා මේ සතියේ ආසියන් සමුළුවට සහභාගී වීමට මැලේසියාවට පැමිණි බව ඔබ සමහරෙක් දකින්නට ඇත. සිකුරාදා සරණාගත ළමයින්ට ආධාර කරන පදනමක කාර්යාලයට ගිය ඔහුට එහිදී එක්සත් ජනපදයේ රැකවරණය ලබා දී ඇති දරුවන් කණ්ඩායමක් හමු වීමට අවස්ථාව ලැබුණි. මේ අතර සිටි 16 හැවිරිදි රොහින්ගියා ගැහැනු දරුවෙක් වයස අවේදී බුරුමයේ ඇගේ නිවසෙන් පැන ආ හැටි ජනාධිපති ඔබාමාට විස්තර කළා. නීති විරෝධී ආකාරයට මිනිසුන් ප්‍රවාහනය කරන්නන්ට අසුවී ඔවුන්ගෙකන් ගැලවුන ඇයගේ අරමුණ ඇය වැනි දරුවන්ට පිහිට වීමයි. ඇය අසලින් වාඩිවූ ජනාධිපති ඔබාමා කියා සිටියේ “මෙම දරුවන් දකින ඕනෑම කෙනෙක් ඔවුන් අපේ දරුවන් මෙන් බවත් ඔවුන්ට ද ආදරය, ආරක්ෂාව හා අධ්‍යාපනයක් ලැබිය යුතු බවත් පිළි ගන්නවා ඇති“ බවයි. ඉන් අනතුරුව ජනාධිපතිතුමා ඇය වැළඳ ගැනීම ලොව පුරාම දකින්නට ලැබුණු අතර එය ඉතා සොඳුරු දර්ශනයක් වූ බව කිව යුතු නොවේ.

මිනිසුන් ශ්‍රී ලංකාවේ අනාගතය ගැන කථා කරන විට ඔවුන් කියා සිටින්නේ සියල්ලන්ම සම්බන්ධ කර ගැනීමේ පණිවුඩයක් ඉහළ සිට පහළට යැවිය යුතු බවයි. මේ මගින් සියලු ප්‍රජාවන්ගේ හඬට කන් දෙන බවට සහතික විය යුතුය. අපේ සමාජයට සියල්ලන්ම ඇතළත් වන බව සහතික කිරීමෙහිලා තීරණාත්මක කාර්ය භාරයක් රජයට පැවරී ඇති බව සත්‍යයකි. නමුත් ඇත්ත වශයෙන්ම මෙය ගොඩ නැගිය යුත්තේ ඔබ වැනි අය විසින් පහළ සිට ඉහළටයි. ජනාධිපතිගේ වැළඳ ගැනීමෙන් පෙන්වාදී ඇති ආකාරයට එය ගොඩ නැගිය හැක්කේ සහකම්පනයෙන් හා අනිත් අයත් අප වැනිම මිනිසුන් බව හා අනිත් දරුවන්ද අපේම දරුවන් මෙන් බව අවබෝධ කර ගැනීමෙනි.

මට එක් උදාහරණයක් ඉදිරිපත් කිරීමට ඉඩ දෙන්න. 2012 දී සුප්‍රසිද්ධ ශ්‍රී ලාංකික ලේඛකයෙක්වූ ෂාම් සෙල්වදොරේ හා රාජ්‍ය නොවන සංවිධානයක්වූ ජාතික සාම මණ්ඩලය එක්ව රටේ වාර්ගික ගැටුමේ ඉතාම දුෂ්කර කාලය ගැන ලිවීමට තරුණ ශ්‍රී ලාංකික නවකථාකරුවන් හා කවීන් එක් කිරීමේ ව්‍යාපෘතියක් දියත් කළේය. මෙයට සහභාගිවන්නන් විවිධ ජනවාර්ගික හා ආගමික පසුබිම්වලින් තෝරා ගන්නා ලදී. සෙල්වදොරේ සඳහන් කර ඇති ආකාරයට " හොඳ ලේඛනවලින් සහකම්පනය ජනනය වන අතර එය විවිධ ප්‍රජාවන් යා කරන පාලම් ගොඩනැගීමට අවස්ථාවක් ලබා දෙයි." මෙම ව්‍යාපෘතිය නම් කරන ලද්දේ "ප්‍රතිසන්ධානය සඳහා ලියන්න" (Write to Reconcile) යනුවෙනි.

මෙයට සහභාගී වූ 23 දෙනා අතරෙන් එක් කෙනෙක් වූයේ සාම්භාවි සිවාජී නම් යාපනෙන් පැමිණි තරුණ කාන්තාවකි. යුද්ධයේ දුෂ්කරම කාල පරිච්ඡේදයේ ඔවුන්ට පාඨ ග්‍රන්ථවත් ලබා ගත නොහැකි වූ අතර ගුරුවරයාට ඒවායේ ඡායා පිටපත් ගැනීම සඳහා කොළඹට පැමිණීමට සිදු විය. පංතියේ සිටි දරුවන් 40 දෙනා ම භාවිතා කළේ මේ එකම ඡායා පිටපතයි. පාසලට යන පාරේ තිබූ මාර්ග බාධක නිසා කෙටි බස් ගමනක් පැය දෙකක ඛේදජනක චාරිකාවක් බවට පත් වී තිබුණි.

මෙම වැඩසටහනේ සම්භාවිට වඩාම බලපෑමක් කළ කොටස වූයේ කථා කියන ආකාරය ඉගෙන ගැනීම නොව අනිත් අය ගෙන් අසා දැන ගත් කථාය. මේ අතර ඇයට කිසි දිනක අසන්නට නො ලැබුණු ආකාරයේ කථා වෙනත් පසුබිම්වලින් පැමිණි අයගෙන් අසන්නට ලැබුණි. නමුත් ඔවුන් තනිවම ඒ දුෂ්කරතා හා දුක්වේදනාවන් විඳ ගෙන තිබුණි. ඇයට ඔවුන්ගේ නිවෙස්වලින් එලවා දමන ලද හෝ දෙමාපියන් අහිමිවූ හෝ අපචාරයන්ට ගොදුරුවූ හෝ තරුණ තරුණියන් හමු වූවාය. සම්භාවි කියා සිටියේ ඇය රට ගැන දකින ආකාරය වෙනස් කළේ මේ පුළුල් දැක්ම බවයි. දැන් ඇය කොළඹ විශ්ව විද්‍යාලයේ දෙවැනි වසරේ ශිෂ්‍යාවක් වන අතර අද මෙහි පැමිණ සිටී. සම්භාවි කරුණාකර මෙහොතකට නැගිටින්න. ( අත්පොළසන්)

"ප්‍රතිසන්ධානය සඳහා ලියන්න" වැඩසටහනට සහභාගී වූ සියලු දෙනාටම නැගිට සිටින ලෙස මා ඉල්ලා සිටින්නේ ඔබට ප්‍රශංසාව පළ කිරීමටයි. වෙනත් අය නැද්ද ? එහෙම නැත්නම් ලැජ්ජාවෙන්ද ? මම හිතුවේ එහෙමයි. (අත්පොළසන්)

මෙම "ප්‍රතිසන්ධානය සඳහා ලියන්න" ව්‍යාපෘතියේ පරිමාණය සාපේක්ෂ වශයෙන් කුඩා ලෙස පෙනෙන නමුත් එහි බලපෑම ඉතා විශාල බව කිව යුතුයි. සම්භාවි හා

ඇගේ සගයන් ලියූ කථා, පොතක් ලෙස පළ කර ශ්‍රී ලංකාව පුරා පාසල් අතර බෙදාහැර තිබේ. මෙම ව්‍යාපෘතියෙන් උගත් පාඩම ඉතා තීරණාත්මක එකකි. අපි එකිනෙකා හඳුනා ගැනීමටත් ඔවුන්ට කන් දීමටත් තැත් කරන විට අප තුළ ඔවුන් ගැන ඇති බිය පහ වනු ඇත. ඔවුන් ද අපට එතරම් වෙනස් නොවන බව ද අපි අවබෝධ කර ගනිමු. අභිමානයෙන් යුතුව සැලකුම් ලැබීමට අප බලාපොරොත්තු වන ආකාරයට ම අප ද ඔවුන්ට සලකනු ඇත.

මෙම ස්වර්ණමය නීතිය මේ රටේ අදහන සියලුම ආගම් ඇතුළු සෑම ආගමකම දක්නට ලැබේ. බුද්ධාගමේ මෙය දැක්වෙන්නේ "ඔබට වේදනාකාරී ලෙස දැනෙන ආකාරයට අන් අයට වේදනා නොකරන්න" යනුවෙනි. හින්දු ආගමේ සඳහන් වන්නේ "ඔබ සැලකුම් ලැබීමට අකමැති ආකාරයට අන් අයට නො සලකන්න" යනුවෙනි. ඉස්ලාම් ආගමේ මෙම අදහස දක්වා ඇත්තේ "තමා කැමති ආකාරයට තම සහෝදරයාටත් සලකන තෙක් ඔබ කිසිවෙකු නියම අදහන්නෙක් නොවෙනු ඇත" යනුවෙනි. මෙම සියලු ආගම්වල දේශනා කර ඇති මූලික සහකම්පනය, ඔබේ පංති කාමරවල, වැඩපොළවල, වැඳුම් පිදුම් කරන ස්ථානවල මෙන් ම ඔබේ දෙමාපියන් හා දරුවන් සමග ගොඩ නැඟීමට ඔබට සහාය විය හැකියි. ඔබ තුළ ඇති බිය හා අවිශ්වාසයට පණ පොවමින් සමහරුන් ඔබේ සමගිය විනාශ කිරීමට තැත් කරන විට ඔබේ ප්‍රජාවන් එකට බැඳ තබන හුය එයයි.

ප්‍රශ්න ඇසීමටත් සාකච්ඡා කිරීමටත් ඉඩ දීම සඳහා මගේ කථාව මෙයින් අවසන් කිරීමට බලාපොරොත්තු වෙමි. ඔබ සියල්ලන්ම දන්නා පරිදි සති කීපයකට පෙර ශ්‍රී ලංකාවේ සිටි ශ්‍රේෂ්ඨතම නායකයෙක්වූ සෝභිත හිමියන් අපට අහිමි විය. විධායක බලය සීමා කිරීමේ අවශ්‍යතාව හා අදහස් පළ කිරීමේ නිදහස ආරක්ෂා කර ගැනීම වැනි ගැටලු වලදී එතුමා ජාතියට සදාචාරවත් මග පෙන්වන්නෙක් විය. නමුත් ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රජාවන් අතර ප්‍රතිසන්ධානයක් ගොඩනැඟීමේ අවශ්‍යතාව ගැන එතුමාට ඉතා පැහැදිලි මෙන් ම උද්යෝගී මතයක් තිබුණි. උන්වහන්සේ කියා සිටියේ "ශ්‍රී ලංකාව යනු සිංහල, දෙමළ, මුස්ලිම්, මැලේ හා බර්ගර් යන විවිධ ජන කණ්ඩායම් ජීවත්වන කුඩා දූපතක් බැවින් එකමුතුව ජීවත් වීමට ඉගෙන ගත යුතු" බවයි. "අප බෙදුණු හැම අවස්ථාවකම පරාජයට පත් වුනෙමු. තිස් අවුරුදු යුද්ධයෙන් අප කිසිවෙක් ජයග්‍රහණය නො කළ අතර සියල්ලන්ම පරාජය වී තිබේ" යයිද එතුමා පවසා තිබේ.

සෝභිත හිමියන් විස්තර කර ඇති භේදකාරී ප්‍රවනතාව නිසා ලොව පුරා විවිධ පෙදෙස්වල ආරවුල් හට ගෙන ඇති බව අපට ලැබෙන ප්‍රවෘත්තිවලින් පෙනේ. පසුගිය සති කිපය ගැන පමණක් සිතන්න. අපේ මතකයට එන්නේ ඇන්කරා, සිනායි, බීරුට්, පැරිස් හා බැමකෝ ආදියේ සිද්ධීන්ය. තත්වය ඉතා අසතුටුදායක බව පෙනේ. ශ්‍රී ලංකාවේ ඔබ කරන දේ වඩාත් වැදගත් වන්නේ ඒ නිසායි. ලොව පුරා ජනතාව ශ්‍රී ලංකාව දෙස බලා සිටිති. අප කථා කරන්නේ ඔබ මෙහි ආරම්භ කර ඇති ක්‍රියාවලිය ගැනයි. ඔබේ ප්‍රයත්නයට අපි සම්පූර්ණයෙන්ම සහාය දක්වමු.

එක්සත් ජනපදය සම්බන්ධයෙන් මෙය විශේෂයෙන් සත්‍ය වේ. “ශ්‍රී ලංකාවේ සිදුවන්නේ කුමක්ද? ත්‍රස්තවාදය වැළැක්වීමේ පනතට වෙන්නේ කුමක්ද? ඉඩම් ලබාදීම ගැන සිදුවන්නේ කුමක්ද? ප්‍රතිසන්ධාන කටයුත වල තත්වය කුමක්ද? ආදි ප්‍රශ්න ජනාධිපති ඔබමා අපෙන් නිරතුරුවම අසයි. ජනතාවද මෙම ප්‍රශ්නම අසයි. සිදුවන්නේ කුමක්දැයි දැන ගැනීමට ඔවුන්ට අවශ්‍යයි. තරුණයන්ගේ තත්වය කුමක්ද? රැකියා තත්වය කෙසේද? ශ්‍රී ලංකාවේ සිදුවන්නේ කුමක්දැයි දැන ගැනීමට ඔවුන්ට අවශ්‍යයි. යෝධ අභියෝගයන්ට මුහුණ දෙන ඔබ අසල සිට ඔබට සහයෝගය දැක්වීමට අපි කැමැත්තෙමු.

වෙනස්වීම් අවශ්‍ය තරම් වේගයෙන් සිදු නොවන බවට හැඟීමක් ඇති බව මම දනිමි. ප්‍රතිසංස්කරණවාදීන්ට වෙනස සිදු වන්නේ ඉතා සෙමින් බව දැනෙනු ඇත. නමුත් ඔබේ නොඉවසිල්ල නිසා හඬ නැගීමට ඇති ඔබේ කැපවීම අත්හැරිය යුතු නැත. ඒ නිසාම අන් අයගේ හඬට කන් දීම අත්හැර දැමිය යුතු ද නැත. ඔබ වඩාත් ම මේ කටයුතුවලට සම්බන්ධ විය යුත්තේ ඔබේ නොඉවසිලිමත් හැඟීම වැඩීවූ විටයි. ඔබටත් ඔබේ රටටත් ඉතා අවශ්‍යව ඇති වෙනස ළඟා කර ගත හැක්කේ වැඩි වැඩියෙන් ඒ සඳහා කැපවීමෙන් පමණි.

ඒ නිසා මේ කටයුතුවලට දිගටම සම්බන්ධව සිටින්න. බියට ඔබේ නරක උපදේශකයා වීමට ඉඩ නොදෙන්න. අන් අයගේ අභිමානය දැකීමට ඔබට සහාය වීමට සහකම්පනයට ඉඩ දෙන්න. ඔබ ඒ මග ගත හොත් ඔබටත්, ඔබේ රටටත් ළඟා කර ගත හැකි දේවල සීමාවක් නැත.

ඔබට බොහොම ස්තුතියි. (අත්පොළසන්) දැන් ප්‍රශ්න ඇසීමේ කාලයයි.

**මෙහෙයවන්නා:** මම හිතන්නේ දැන් අපට ප්‍රශ්න කීපයක් ඉදිරිපත් කළ හැකියි.

**තානාපතිනි පවර්:** ඔව් සත්තකින්ම

**ප්‍රශ්නය:** තානාපතිනි පවර් මහත්මිය, අපි ඔබ සාදරයෙන් පිළිගන්නවා. මට දැන ගැනීමට අවශ්‍ය එක්සත් ජනපදයත් ශ්‍රී ලංකාවත් ඉදිරිපත් කල යෝජනාව ____

**තානාපතිනි පවර්:** මයික්‍රොෆෝනයක් තියෙනවාද? හරි.

**ප්‍රශ්නය:** මගේ ප්‍රශ්නය ශ්‍රී ලංකාවේ රජයත් එක්සත් ජනපදයේ රජයත් එක්ව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මණ්ඩලයට ඉදිරිපත් කළ යෝජනාව ගැනයි. (පැහැදිලි නැත) ප්‍රතිසංස්කරණවල ඊළඟ පියවර ගැන ඔබේ අදහස් දැන ගැනීමට කැමතියි. යෝජනාව නොව ( පැහැදිලි නැත) ශ්‍රී ලංකාව ගත යුතු ඉදිරි පියවර (පැහැදිලි නැත) එහි සඳහන් දේ ළඟා කර ගැනීමට ශ්‍රී ලංකාව ගත යුතු (පැහැදිලි නැත)

**තානාපතිනි පවර්:** සැප්තැම්බරයේ මානව හිමිකම් මණ්ඩලයට ඉදිරිපත් කරන ලද යෝජනාවට ශ්‍රී ලංකාව සහයෝගය දීම පමණක් නොව එයට සම අනුග්‍රහකත්වය දැක්වීමට ඉදිරිපත් වීම සාධාරණත්වයේ හා වග වීමේ අදහස් ප්‍රවර්ධනය කිරීමට කටයුතු කළ සියලු දෙනාට ම ඉතා විස්මය ජනක අත්දැකීමක් වූ බව පළමුවෙන් ම ප්‍රකාශ කළ යුතුයි. දරුණු අපරාධ සිදු කළ වැරදිකරුවන් සොයා ගැනීමට දේශිය ක්‍රියාවලියක් ආරම්භ කරන ලෙස ඉල්ලමින් ඉදිරිපත් වූ යෝජනා තුනකට ම කලින් පැවති ආණ්ඩුව, විරුද්ධව කටයුතු කිරීමෙන් පසුව මෙම ස්ථාවරය ගැනීම විශේෂයි.

මේ අනුව ඊළඟ පියවර විය යුත්තේ ඔබ සහ අනිකුත් අය විසින් යෝජනාවට ඇතුලත් කර ඇති ඉතා වැදගත් උපදේශක ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමයි. ඊයේ උතුරට යෑමෙන් පසුව මා දැන ගත් කරුණක් නම් රටේ කොතැනට ගියත් යුද්ධය ඒ ඒ පවුල්වලට බලපෑ ආකාරය පිළිබඳ එකිනෙකට වෙනස් විස්තර අසන්නට හැකි බවයි. මේ නිසා රටේ ජීවත් වන සෑම කෙනෙක් ම මේ සම්බන්ධයෙන් හඬක් නැගිය යුතු අතර මෙමම ක්‍රියාවලිය සිදු විය යුත්තේ කෙසේ ද යන්න ගැන අදහස් ප්‍රකාශ කිරීමට මගක් සොයා ගත යුතුය.

මෙහිදී උපදේශන සාකච්ඡා ඉතා වැදගත් වේ. යුද්ධයේ බලපෑමට බෙහෙවින් ම ලක්වූ ප්‍රජාවන් හා ත්‍රස්තවාදයේ ගොදුරු බවට පත්වූවන් ට හැඟී යන්නේ ඔවුන්ට හඬක් නැති බවත් ඔවුන්ගේ අභිමානයට ගරු නො කරන බවත්ය. යුද්ධ කාලයේ මෙන්ම

ඉන් පසුවත් මෙය සිදු වේ. අතුරුදහන්වූ පවුලේ සාමාජිකයෙකුගේ ඡායාරූපයක් ගෙන තැනින් තැනට යන, ඔවුන්ගේ  දුර කථන ඇමතුම් වලට පිළිතුරු දීමටවත් කෙනෙක් නැත. මේ නිසා ඉදිරියට යෑමට නම්  මෙම උපදේශන ක්‍රියාවලිය  ඉතා පුළුල් ව හා ගැඹුරට සිදු කළ යුතුයි. ඉතා වැදගත් වන උපදේශන  සාකච්ඡා ඉක්මනින් ආරම්භ කිරීමට අවශ්‍ය ආයතන වහා පිහිටුවීමට පියවර ගත යුතුයි.

ගැටුමට ලක්වූ ප්‍රජාවන්ගෙන් තොරතුරු ලබා ගැනීම ඉතා තීරණාත්මක වේ.  එය උපදේශන ක්‍රියාවලියේ කොටසකි. මේ සඳහා ස්ථාපනය කරන ආයතනවල ඉහළ ගුණාත්මක බවක් තිබිය යුතුය. මෙහි ගත කළ කාලය තුළ මා දුටු සිවිල් සමාජයේ කටයුතුවලින් මම ඉතා පැහැදීමට පත් වූයෙමි.  මෙම වග වීමේ යාන්ත්‍රණය කුමන ආකාරයක් ගත යුතුද යන්න සාකච්ඡාවට භාජනය වෙමින් පවතී. සම්ප්‍රදායික උපදේශක කව වලින් බාහිරව කොතරම් දුරට රජය උපදේශන සාකච්ඡා පැවැත්වීමට සූදානම් ද යන්නත් මෙහිදී වැදගත් වේ.

මෙම පවුල්වලට තමන්ගේ අභිමානය පිළිබඳ හැඟීමක් ලබා දෙන  ක්‍රියාවලියක් ඉක්මනින් ම ආරම්භ කළ යුතු බව මම නැවතත් ප්‍රකාශ කිරීමට කැමතියි.  එය යුද්ධයේ බලපෑමට ලක්වූ ප්‍රජාවන් මෙන්ම  ජාත්‍යන්තරය  විසින් සාධාරණ හා විශ්වසනීය ක්‍රියාවලියක් ලෙස සලකන ක්‍රියාමාර්ගයක් වීම අවශ්‍ය වේ. අප හැම කෙනෙකුට අවශ්‍යව ඇත්තේ මේ පරිච්ඡේදය  අවසන් කිරීමටයි.  නමුත් කාලයක් තිස්සේ මෙහි  මුල් බැස ගෙන ඇති වැරදිකරුවන්ට දඬුවම් නො කිරීමේ  සංස්කෘතිය අවසන් කරමින්  ජනතාවට සත්‍යය දැන ගැනීමට සලස්වන ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම ඉතා වැදගත් යයි මම සිතමි.

**ප්‍රශ්නය:** ඔබ සිතන හැටියට ශ්‍රී ලංකාවේ ප්‍රතිසන්ධාන ක්‍රියාවලියට ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ට දායකත්වයක් ලබා දිය හැක්කේ කුමන ආකාරයෙන් ද?

**තානාපතිනි පවර්:** ඔබට ස්තුතියි. තරුණ ජනතාවට මෙම ක්‍රියාවලියට සම්බන්ධ විය හැකි සියලු ක්‍රම විස්තර කිරීමට මා ඒ පිළිබඳ  විශේෂඥයෙක් නොවේ. නමුත් මට කිව හැක්කේ එය ඔබ පිළිබඳව බවයි.  ත්‍රස්තවාදයට බයෙන් ජීවත්වීම හෝ  යුද්ධය නිසා මුහුණ දුන් පීඩාවන් පිළිබඳ ප්‍රබල මතකයන් ඇත්තේ ඔබේ පරම්පරාවටයි. ඔබ හෝ ඔබේ පවුලේ සාමාජිකයන් අවතැන් වන්නට ඇත.  පවුල් සාමාජිකයන් අහිමිවීමෙන් හෝ අතුරුදහන්වීමෙන් ඔබ පීඩාවට පත්වන්නට ඇත.

මේවාට මුහුණ දුන් තරුණයන් වන ඔබට අතීත් ප්‍රජාවන් සමග සම්බන්ධතා ගොඩනැගීමටත් පුළුල් අර්ථයෙන් තමන් ශ්‍රී ලාංකික පුරවැසියන් ලෙස හඳුන්වා ගැනීමටත් දැන් අවස්ථාව උදාවී තිබේ. මේ රටේ ඇති විවිධත්වය ගැන ඔබට ආඩම්බර විය හැකියි. අතීතයේ වෙන් වීමට යොදා ගත් වෙනස්කම් දැන් එක්වීමට යොදා ගත හැකි වීම විස්මය ජනකය.

මා දැන ගත් ආකාරයට දශක ගණනාවක් තිස්සේ මේ රටේ ශිෂ්‍යයන්ට දේශපාලන වශයෙන් ක්‍රියාකාරී වීමේ විශිෂ්ට සම්ප්‍රදායක් තිබේ. රටේ අනාගතය තමන්ට අවශ්‍ය ආකාරයට සකස් කර ගැනීමට ඔවුන් ප්‍රයත්න දරා තිබේ. මේ ආකාරයට තරුණ තරුණියන් දේශපාලනයට හා රාජ්‍ය සේවයට එක්වීම සුබ ලකුණකි. මම මාධ්‍යවේදිනියක් හා ක්‍රියාකාරිනියක් ලෙස නිදහස් ජීවිතයක් ගත කර ඇත්තෙමි. හැම විටම මගේ සිතේ ඇති දේ ප්‍රකාශ කිරීමටත් රජය විවේචනය කිරීමටත් මා පසුබට වූයේ නැත. රජයට එක්වීමට පෙර මා කාලය ගත කළේ ඒ විදියටයි. (සිනා) පිටස්තරයෙක්ව සිට යෝධ ආයතනයක් ඇතුළට යෑම විශාල සංක්‍රාන්තියකි.

අනවශ්‍ය නීතිරීති හා අමාත්‍යංශ ගණන ආදිය අතින් අපි ශ්‍රී ලංකාව තරම් නිලධාරීවාදී නොවේ. එක් අතකින් අපිත් ඉතා නිලධාරීවාදි වෙමු. (සිනා) ඔබ වැනි තරුණයින්ට ඉන්ජිනේරුවන්, වාස්තු විද්‍යාඥයින්, තාක්ෂණික වෘත්තිකයන් හෝ ව්‍යවසායකයන් විය හැක. ඔබට කළ හැකි බොහෝ දේ තිබේ. ඔබට අවශ්‍ය නම් ගුරුවරයෙක් වීමට පුළුවන. ඔබ සමහරෙකුට රජයට, සිවිල් සේවයට හෝ පාර්ලිමේන්තුවට යා හැකියි. බොහෝ ගැටලු වලට විසඳුම් ලබා දිය හැක්කේ පාර්ලිමේන්තුවටයි. රූපවාහිනියේ දේශපාලනඥයින් එකිනෙකා සමග වාද කර ගන්නා විට ඔබට ඒ චැනලය මාරු කිරීමට සිතෙන්නේ නම් ඒ ඔබ දේශපාලනඥයෙක් විය යුතු බවට සංඥාවකි. ඔබට චැනලය මාරු කිරීමට අවශ්‍ය නම්, දැන් දේශපාලනය සිදු වන ආකාරයට ඔබ කැමති නැත්නම්, ඔබ එය ඇතුළට ගොස් එය වෙනස් කළ යුතුය.

නව රජය අලුත් අදහස් වලට මෙන්ම තරුණ ජීවගුණයට විවෘත යයි මම සිතමි. ඔවුන් සෑම දෙයක්ම කරන්නේ ඔබේ පරම්පරාව සඳහා බව රජය කියා තිබේ. එක්සත් ජනපදය ඔවුන්ට සහයෝගය දැක්වීමට එක් හේතුවක් එයයි. තරමක් දුෂ්කර වුවත් නියම සංකලනය ලබා ගැනීම විශිෂ්ට ජයග්‍රහණයක් වනු ඇත.

**ප්‍රශ්නය:** තානාපතිතුමියනි, මම ඇක්ෂන් එගේන්ස් ඇපති (Action Against Apathy) නම් සංවිධානය නියෝජනය කරන ඉෂාන් ජලීල්. මම ඉදිරිපත් කරන්නේ ප්‍රකාශයක් හා ප්‍රශ්නයක්. මේ අවුරුද්දේ ජනවාරි 8 වැනිදාට පෙර ඔබද දන්නා පරිදි මානව හිමිකම් ගැන කථා කළ ඕනෑම කෙනෙක් හංවඩු ගසන ලද්දේ දේශද්‍රෝහියෙක් හා බටහිරට ලැදි කුමන්ත්‍රණකරුවෙක් ලෙසයි. වාසනාවකට මෙන් ජනවාරි 8 වැනිදායින් පසුව මෙම තත්වය වෙනස් වී තිබේ.

රාජ්‍ය තාන්ත්‍රිකයෙක් වීමට පෙර ඉතා පුළුල් ලෙස මානව හිමිකම් ක්ෂේත්‍රයේ කටයුතු කර ඇති පුද්ගලයෙක් ලෙස, මේ රටේ මානව හිමිකම් ආරක්ෂා කිරීමට, ප්‍රවර්ධනය කිරීමට මෙන් ම සහතික කිරීමටත් මෙය මානව හිමිකම් හිතවාදී රටක් බවට පත් කිරීමටත් ශ්‍රී ලාංකික තරුණයින්ට ඔබ දෙන අවවාදය කුමක් ද? ඔබට ස්තුතියි.

**තානාපතිනි පවර්:** ස්තුතියි. පළමුවෙන්ම ඔබ දැක්වූ අදහස ගැන කථා කිරීමට මට ඉඩ දෙන්න. මම හිතනවා එය ඉතාම වැදගත් කියා. ශ්‍රී ලංකාවේ සිදුවූ දේ ලොව පුරාම සිදු වන දෙයක්. මොන පක්ෂයේ වුවත් දේශපාලනඥයින්ට - සියලුම පක්ෂ වල අයට - ජනතාවගේ අවධානය වෙන අතකට යොමු කරන්නට අවශ්‍ය වූ විට ඔවුන් විදේශිකයින්ට හෝ බටහිරට හෝ යටත් විජිතවාදයට හෝ වරද පටවනවා. ඉතිහාසයේ මෙවැනි වැරදි සිදුවී තිබෙනවා පමණක් නොව දැනුත් එවැනි දේ ගැන සාධාරණ විවේචන තිබෙන බව අපි පිළිගත යුතුයි.

නමුත් මේ වෙනසේ වැදගත්කම වන්නේ බාහිර ලෝකය ඒ සම්බන්ධයෙන් කිසිවක් නො කිරීමයි. මේ වෙනස ගෙන ආවේ තමාගේ සගයන් මරන බව හෝ අතුරුදහන් කරවන බව දුටු විට බිය පසෙක ලා ඒ ගැන ලියූ මාධ්‍යවේදීන් හා ශ්‍රී ලාංකික ජනතාවයි. ඔවුන් විශ්වාස කළ මූලධර්ම ගැන ඔවුන් දිගටම කතුවැකි පළ කළා. ඡන්දය දී ඒ වෙනස ගෙන ආවේ සමහර විට පළමු වරට ඡන්දය ප්‍රකාශ කළ මේ රටේ තරුණ පරම්පරාවයි.

ඔබේ රටේ සිදුවූ දෙය සම්පූර්ණයෙන්ම ශ්‍රී ලාංකික කථාවකි. ජිනීවා හි සිදුවූ ක්‍රියාකාරකම් ද පිටස්තර දෙයක් ලෙස පෙන්වීමට තැත් කළත් එයට මූලික වූයේ සහාය හා වැරගැන්නුම අපේක්ෂා කළ ශ්‍රී ලංකාවේ සිවිල් සමාජයයි. ප්‍රජාතන්ත්‍රීය වගවීමක් තිබුණේ නම් හෝ අතුරුදහන්වූ අයගේ පවුල් සාමාජිකයන්ට සත්‍යය දැනුම් දුන්නේ නම් හෝ සිවිල් සමාජයට මේ ආකාරයට කටයුතු කිරීම අවශ්‍ය නොවනු ඇත. නැතිවූ පවුලේ සාමාජිකයාගේ ඡායාරූපයක්වත් දැක ගැනීමේ

බලාපොරොත්තුවෙන් දිනපතාම රූපවාහිනී තරඟන හා පුවත්පත් කියවන පවුල් මට ඊයේ යාපනේදී මුණ ගැසුණි. මෙම පවුල්වලට සහනයක් ලබා දීමට පසුගිය දශකය තුළ මේ රටේ යම් කිසි යාන්ත්‍රණයක් තිබුණේ නම්, ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීමට බෙදීම් වෙනුවට ප්‍රතිසන්ධානයට පණ පොවන යාන්ත්‍රණයක් තිබුණේ නම් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ කිසිවක් සිදු නොවනු ඇත. එවැනි ක්‍රම තිබුණේ නම් සිවිල් සමාජය එම ක්‍රම ප්‍රයෝජනයට ගනු ඇත.

ඔබ ඉදිරිපත් කළ අදහසට මම එම ප්‍රතිචාරය දැක්වූයේ ඔබේ ප්‍රශ්නයට පිළිතුර ද එයම වන බැවිනි. ශ්‍රී ලාංකිකයන් අවශ්‍ය දේ කර තිබේ. මැතිවරණ දෙකකදී ශ්‍රී ලාංකිකයන් ප්‍රජාතන්ත්‍රීය වගවීමේ වැදගත්කම සනාථ කර තිබේ. ආණ්ඩුවට පිටින් කටයුතු කරමින් සිට මා රජය ඇතුළට ගිය ආකාරය කලින් විස්තර කළෙමි. නිරතුරුවම විවේචනයට ලක් වෙමින් රජය තුළ සිටීම විනෝදයක් නොවේ. රජයට පිටින් සිටින අයගේ රාජකාරිය වන්නේ අපේක්ෂිත ආකාරයට අප ක්‍රියා නො කරන විට ඒ බව දැන්වීමයි.

මේ රජය ඉතා වැදගත් පොරොන්දු ගණනාවක් දී තිබේ. මේ රටේ මානව හිමිකම් දියුණු වීමෙන් පෙනී යන්නේ රජය ලබා දුන් පොරොන්දු අනුව කටයුතු කරන බවයි. මානව හිමිකම් යනු වියුක්තව පවතින දෙයක් නොවේ. ජනතාව එම අයිතිවාසිකම් රැක ගත යුතුය. ඔවුන් උසාවිවලට ගොස් ඒවා ක්‍රියාත්මක වන බව සහතික කර ගත යුතුය. එක්වී කටයුතු කිරීමේ නිදහස යොදා ගනිමින්, අවදානම් තත්වයන්ට මුහුණ දෙමින්, පෑනේ බලය යොදා ගනිමින්, තමන් දකින ආකාරයට සත්‍යය හෙළි කළ යුතුය. අවදානම නොතකා පසුගිය දුෂ්කර කාල පරිච්ඡේදයේ කටයුතු කළ ආකාරයට දිගටම ක්‍රියාකාරී විය යුතුය.

මගේ ප්‍රධාන පිළිතුර වන්නේ ඔබ කරන දේ දිගටම කරගෙන යන්න. මුළු ලෝකයේම අවධානය දිනා ගැනීමට එය සමත් වී තිබේ.

**ප්‍රශ්නය:** *(පරිවර්තකයා හරහා)* මම ( පැහැදිලි නැත) නියෝජනය කරන්නේ (පැහැදිලි නැත) ඉංග්‍රීසියෙන් කථා කිරීමට නොහැකි වීම ගැන මට සමා වෙන්න. උතුරු නැගෙනහිර නියෝජිතයෙකු ලෙස උතුරු නැගෙනහිර ජනයා අවුරුදු 60ක් තිස්සේ විවිධ ප්‍රශ්නවලින් පීඩා විඳින බව දැන්වීමට කැමතියි. අපි ශ්‍රී ලංකාව අපේ රට ලෙස පිළි ගන්නවා. එක්සත් ජනපදය අනුග්‍රහය දක්වන විසඳුම කුමක් ද?

අපි බෙදුම්වාදීන් නොවෙමු. මේ ශාලාවේ සිංහල සහෝදරයන් බොහෝ ගණනක් සිටී. අපේ ප්‍රදේශයට පැමිණ කඳවුරු හා අපේ ජනතාව දුක් විඳින ආකාරය දැක ගන්නා ලෙස මම ඔබෙන් ඉල්ලා සිටිමි. එක්සත් ජනපදය ආධාර කරන්නේ කුමන ආකාරයක විසඳුමකටදැයි දැන ගැනිමට මා කැමතියි. දෙමළ ජාතික සන්ධානයේ නියෝජිතයෙක් ලෙස මා එය දැන ගැනීමට කැමතියි.

**තානාපතිනි පවර්:** මහත්මයාණනි, ඔබට බොහොම ස්තුතියි. ඉංග්‍රීසියෙන් කථා කිරීමට සිදුවීම ගැන මට කනගාටුයි. මට වෘත්තිය එල්ලේ ක්‍රීඩිකාවක් විය හැකි වුවත් ඔබේ භාෂාවෙන් කථා කිරීමට හැකි වේයයි සිතන්නට බැහැ. (සිනා)

මා කලින් කී දේ විස්තරාත්මකව ඉදිරිපත් කිරීමට ඉඩ දෙන්න. මානව හිමිකම් වැඩි දියුණු කිරීමේ එක් කොටසක් වන්නේ රට පුරා ජනතාවගේ සාමාජීය හා ආර්ථික තත්වයේ දියුණුවක් සහතික කිරීමයි. ඔබ ප්‍රකාශ කළ එක දෙයක් ඉතාම වැදගත්. ඔබ මෙහි සිටින සහෝදර සහෝදරියන්ට උතුරු නැගෙනහිර තත්වය දැක බලා ගැනීමට එන ලෙස ආරාධනය කළා. මගේ අදහස් දැක්වීමේ දී මා කීවේත් එවැනි දේ ගැනයි. අපට අනිකාගේ ඇසින් තත්වය දැක ගත හැකි ද? පරම්පරා ගණනාවක් ජීවත්වූ නිවසෙන් ඉවතට ඇද දමා ඇති කෙනෙකුගේ තත්වය අපට සිතා ගත හැකි ද? දිනපතාම එහි ගොස් එම නිවස හා ඉඩම නැවත ලබා ගැනීමට උත්සාහ කරන ඔබට කිසිම සැලකිල්ලක් නොදැක්වූ විට ඇති වන හැඟීම ගැන ඔබට සිතා ගත හැකි ද?

එවැනි තත්වයන් යටතේ ජීවත් නොවන අයට එවැනි තත්වයන් අවබෝධ කර ගත හැකි ද? මෙය එක් පාර්ශවයක් හෝ අනිත් මිනිසුන් පිළිබඳ කථාවක් නොවන බැවින් සංවාදය ඇති විය යුත්තේ එතනයි. මේ ජනතාව ජීවත් වන්නේ දශක ගණනාවක් තිස්සේ මේ රට බෙදීමට තැත් කළ උරුමයක් යටතේයි.

මේ නිසා වැඩි වැඩියෙන් සංවාද හා සම්මුතිවලට එළඹීම අවශ්‍යයි. වැඩියෙන්ම යුද්ධයේ බලපෑමට ලක්වී ඇති ප්‍රදේශ, අනාරක්ෂිත පුද්ගලයන් සිටින ප්‍රදේශ, අන්ත දුගී බවින් හෝ යෝධ හානි සිදුවීමෙන් පීඩා විඳින අයගේ ගැටලු විසඳීමට වැඩියෙන් මුදල් ආයෝජනය කිරීමට එක්සත් ජනපදය බලාපොරොත්තු වෙයි. අනිත් රටවල් ද එසේ කිරීමට එනම් සංවර්ධනයට, රැකියා ඇති කිරීමට යොමු කිරීමට අපේක්ෂා කරමු.. ඒවා ඉතා වැදගත් වනු ඇත.

නමුත් මේ රටේ ප්‍රජාවන් වෙන වෙනම සංවර්ධනය වුවහොත් හා එකිනෙකා දැන හැඳින නොගත්තොත් බෙදීම් ඇති කිරීමට උනන්දු වන අයට වාසියක් වනු ඇත. විවිධ ප්‍රජාවන් එකිනෙකා දැන හැඳින ගැනීම වළක්වන යටි අරමුණු ඇති අය සිටිති. සෑම රටක ම මෙවැනි අන්තවාදීන් දකින්නට ලැබේ. නමුත් මේ රටේ ජීවත් වන බහුතරයේ අවශ්‍යතාව වන්නේ ඔවුන්ගේ දරුවන්ට වඩා සැපවත් ජීවිතයක් ලබා දීමත්, බියෙන් සැකෙන් තොරව රටේ ඕනෑම තැනකට යෑමට හැකි වීමත්, සිතේ ඇති දේ කීමට නිදහසත්, නායකයන් දූෂිත නම් ඔවුන් ඉවත් කර ඔහු ඒවාට වගකියන බව සහතික කිරීමත්, ඔබේ පරම්පරාවේ අයට රැකියා අවස්ථා උදාකරදීමත් වේ.

මේවා ඉතා මූලික විශ්ව සාධාරණ අපේක්ෂාවන්ය. සෑම ප්‍රජාවකටම ඒවා පොදු කරුණු වේ. නමුත් සමහර විට යමෙක් අනිත් ප්‍රජාව දෙස බලන්නේ ඓතිහාසික ආරෝවේ දෘෂ්ටි කෝණයෙනි. අප අතර ඇති සමානකම් දෙස බැලිය හැකි නම් අපට විශාල ප්‍රගතියක් ලබා ගත හැක. එය ඉතා දිරිගන්වන සුළුය. මෙහි ඒමට පෙර මම ඔබේ ජනාධිපතිත්, විරුද්ධ පක්ෂ නායකයාත් හමු වුයෙමි. ඔවුන් එකට එක්වී වැඩ කිරීමට උත්සාහයක් දරන බව ඔබ ද දන්නවා ඇත. අවුරුදු ගණනාවකට පෙර තමන්ගේ ඉඩම් හා නිවෙස් අහිමි වූ සමහර දෙනෙකුට හමුදාව විසින් එම ඉඩම් ආපසු ලබා දී තිබේ. නමුත් එය ප්‍රමාණවත් නැත.

අද ශ්‍රී ලංකාවේ සමහරුන් වීදුරුව අඩක් පීරී ඇති ලෙස දකින අතර සමහරුන් එය දකින්නේ අඩක් හිස් ලෙසයි. මෙයින් එක් ආකාරයකින් හෝ එය දෙස බැලීමට මම ඔබට නොකියමි. එය අඩක් හිස් ලෙස දකින විට ඔබ නෙඉවසිලිවන්තවී තවත් වෙනස්කම් සඳහා ක්‍රියා කරනු ඇත. වීදුරුව අඩක් පිරී ඇති ලෙස දකින විට ඔබ සර්ව ශුභවාදීව ඉදිරියට යන බව සිතයි. මේ අනුව ඔබ වර්තමාන තත්වය දෙස කුමන ආකාරයට බැලුවත් ඔබට වෙනස සඳහා ක්‍රියාකාරිකයෙකු විය හැකියි. නමුත් ඔබ අනිකාගේ දෘෂ්ටිකෝණයෙන් බැලිමට අසමත් වුවහොත්, අවතැන් කඳවුරක තත්වය බැලීමට නොගිය හොත්, ත්‍රස්තවාදයෙන් මිදුණු කෙනෙක් ජීවත් වන ආකාරය හෝ එවැනි පුවුල් තවමත් විඳවන මානසික තිගැස්ම අවබෝධ කර ගැනීමට අසමත් වුවහොත් මේ රටට අවශ්‍ය පරිවර්තනය ගෙන ඒම දුෂ්කර වනු ඇත. ඒ නිසා සෑම කෙනෙක් ම කළ යුත්තේ අනිකා දැන හඳුනා ගැනීමට පියවර ගැනීමයි.

**මෙහෙයවන්නා:** අපට පිළිතුරු දිමට ෆෙස්බුක් ප්‍රශ්න ගණනාවක්ම ඇති නිසා දැන් අපි එයින් එකක් ගනිමු.

**තානාපතිනි පවර්:** හොඳයි.

**මෙහෙයවන්නා:** මේක (පැහැදිලි නැත) ඉතා හොඳ ප්‍රශ්නයක්. ඇය අසනවා " හිතවත් ගරු මහත්මියනි, ඔබ ශ්‍රී ලංකාවට පැමිණීමේ සැබෑ අරමුණ කුමක් ද?" කියා (සිනා)

**තානාපතිනි පවර්:** සැබෑ අරමුණ. මගේ ක්‍රීඩා අභිලාෂයන් මම දැනට ම ප්‍රකාශ කර තිබෙනවා, (සිනා) ඇත්තෙන්ම මා මෙහි ආවේ දිනපතා පුවත්පත් කියවීමෙන් මා තරමක් අසහනයට පත්වී සිටින නිසායි. ලොව පුරා ත්‍රස්තවාදී ප්‍රහාරවලින් අහිංසක මිනිසුන් දිනපතා මිය යනවා, විශේෂයෙන්ම උප සහරා අප්‍රිකාවේ නායකයන් ඔවුන්ගේ ව්‍යවස්ථාවලින් ඉඩ දී නැති ආකාරයට බලයේ රැඳී සිටීමට උත්සාහ කරනවා. ඔවුන්ගේ ධුර කාල දෙක දැන් අවසානයි. ඔවුන්ගේ ව්‍යවස්ථා වෙනස් කිරීමට තැත් කරන, තමන්ට පක්ෂපාති තීන්දුවක් ලබා ගැනීමට උසාවියේ විනිශ්චයකාරයන් වෙනස් කිරීමට තැත් කරන නායකයන් ගණනාවක් සිටිනවා. මූලික වශයෙන් මොවුන් උනන්දු වන්නේ ජනතාවගේ යහපත ගැන නොව ඔවුන්ගේ බලය රැක ගැනීමට වන අතර ත්‍රස්තවාදීන් තැත් කරන්නේ මිනිස් වර්ගයාගේ සුබසාධනයට ඉහළින් ඔවුන්ගේ ම්ලේච්ඡ මතවාදය ස්ථාපිත කිරීමටයි.

මෙම අඳුරු පසුබිම මත ශ්‍රී ලංකාව කැපී පෙනේ. මා ශ්‍රී ලංකාවට ආවේ මගේ අවශ්‍යතාවට මෙන් ම ඔබට ආධාර කිරීමටයි. මෙහි සිදු වන දේ ඉතා ප්‍රබෝධ ජනකයි. වගවීම පිළිබඳ ප්‍රතිසංස්කරණ, ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූවන්ට සාධාරණය, ආදි කරුණු සම්බන්ධයෙන් තවම කිසිවක් සිදුවී නැති බව මම දනිමි. නමුත් මෙතරම් කෙටි කාලයක් තුළ මෙතරම් වෙනසක් සිදුවූ වෙනත් රටක් ගැන මට සිතා ගත නොහැක. මම සිටින්නේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිසා එවැනි රටක් ඇත්නම් මා දැන ගත යුතුයි.(සිනා)

බුරුමයේ තත්වයද ඉතා සිත් ගන්නා සුළුයි. හමුදාව හා බුරුම රජය මැතිවරණ ප්‍රතිඵල පිළිගැනීම ගැන අපි සතුටු වෙමු. නමුත් මැතිවරණයට පෙර බුරුමයේ රොහින්ගියා ජනතාවගේ ඡන්ද අයිතිය සම්පූර්ණයෙන්ම අහිමි කර තිබේ. මේ නිසා විශේෂයෙන්ම මෑතකදී අයිතිවාසිකම් අඩු කළ එහි මුස්ලිම් ජනතාව වෙනුවෙන් කළ යුතු බොහෝ දේ තිබේ.

මෙහිදී ඔබෙන් කෙනෙකුට මෙතෙක් ඉටු කර නැති පොරොන්දු ලැයිස්තුවක් මට ලබා දිය හැකියි. නමුත් මා කලින් ද කී පරිදි මෙතරම් කෙටි කාලයක් තුළ මෙතරම් වෙනසක් සිදුවූ රටක් ලෝකයේ කොතැනක වත් නැත. මට අවශ්‍ය වූයේ මෙහි පැමිණ එය දැක ගැනීමටයි. දැන් මට වඩා සතුටෙන් ඊළඟ සතියේ වැඩට යා හැකියි. එලෙස ම ඔබේ මේ ගමනට ආධාර කිරීමට එක්සත් ජනපදයට කළ හැකි දේ ගැන ජනාධිපති ඔබාමා සමග මට සාකච්ඡා කළ හැකියි.

මගේ සංචාරය පිටුපස ඇති අඳුරු කුමන්ත්‍රණය එයයි. (සිනා)

**මෙහෙයවන්නා:** එම අදහස් අප හා බෙදා හදා ගැනීම ගැන ඔබට ස්තුතියි. අපට තව එක ප්‍රශ්නයකට කාලය තියෙනවා.

**ප්‍රශ්නය:** තානාපතිනි පවර් මහත්මිය, සුභ සැන්දෑවක්. ඔබ සමග මෙසේ සම්බන්ධ වීමට ලැබීම ඇත්තෙන්ම සතුටට කරුණක්. බොහෝ කාන්තාවන්ට ඔබ ආභාසයක් බව මම දන්නවා. ඇය නොව, මම මෙහි පැමිණීම ගැන  මගේ බිරිඳ තරමක් ඊර්ෂ්‍යාවෙන් පසු වෙනවා. (සිනා)

ඔබට ශ්‍රී ලංකාව ගැන කොතෙකුත් ප්‍රශ්න ඉදිරිපත් වන්නට ඇති. මගේ ප්‍රශ්නය ඔබේ පුද්ගලික ගමන් මග.....

**තානාපතිනි පවර්:** මොකක්ද?

**ප්‍රශ්නය:** ඔබේ පුද්ගලික ජීවන ගමන හා ආභාසය ......

**තානාපතිනි පවර්:** හරි.

**ප්‍රශ්නය:** ඔබේ ජීවන මගේ විවිධ  යුග තිබෙනවා.  මාධ්‍යවේදිනියක් ලෙස, විද්‍යාර්ථියෙක් ලෙස හා එක්සත් ජාතීන්ගේ  රාජ්‍ය තාන්ත්‍රිකයෙක් ලෙස ආදී වශයෙන්. මේ සඳහා වෙනස් හැකියාවන් අවශ්‍ය වන අතරම ඒවායේ අභිප්‍රායන්ද වෙනස් වේ. මාධ්‍යවේදිනියක් හෝ ක්‍රියාකාරිනියක් ලෙස ඔබ කළ දේ දැන් ඔබට කළ නොහැකියි. නමුත් ඔබට ඒ නිසා වෙනස් ආකාරයන්ට සේවය කිරීමට අවස්ථාව ලැබී තිබෙනවා.

ඒ ආකාරයට විවිධ අදියරවල සිටින තරුණයින් විශාල සංඛ්‍යාවක්  මේ ශාලාවේ සිටිනවා. ඔබ මේ තරුණයින්ගෙන් ඉල්ලා සිටියා  රජයට ඇතුල් වන ලෙස. නිවැරදි යයි  සිතන සියල්ලම කිරීමට නොහැකි රටවල් - ඔබේ රටම වුවත් විය හැකියි- දකින විට දැනෙන බලාපොරොත්තු  සුන් වීම, ඔබ පුද්ගලිකව කළමනාකරණය කර ගත්තේ කෙසේ ද? නායකත්වය හා මහජන  සේවයේ යෙදීම සඳහා ඔබේ පුද්ගලික ජීවිතයෙන් අපට ලබා ගත හැකි ආභාසය කුමක්ද?

**තානාපතිනි පවර්:** ඔබට බොහෝම ස්තුතියි. මෙය ඉතා සියුම් ප්‍රශ්නයක්. මා හිතන්නේ රජයේ රැකියාවකට යන විට  අත් දකින හැඟීම ඔබ නිවැරදිව ඉදිරිපත් කළා.

පරීක්ෂා හා තහංචිවල ඇති වැදගත්කම, මම ඒවා කළ කාලයට වඩා, රජයේ නිලධාරියෙක් ලෙස  වඩාත් අගය කළා. මම මේ සඳහා එක් උදාහරණයක් දීමට කැමතියි. ඔබාමා පාලනය ආරම්භ වූයේ මෙහි යුද්ධය උච්චතම අවස්ථාවට පත්වී දුෂ්කර අවසානයකට ළං වන කාලයේයි. මානව හිමිකම් හා බහු-පාර්ශවික කටයුතු පිළිබඳ

ජනාධිපතිතුමාගේ උපදේශක වුයේ මමයි. ජාත්‍යන්තර සංවිධාන ගණනාක්ම මෙහි ක්‍රියාකාරී වූ අතර සිදු වන ඛේදජනක දේ පිළිබඳව අපේ තානාපති බොබ් බ්ලේක් අප නිරතුරුව දැනුවත් කළේය. විමුක්ති කොටි සංවිධානය පරාජය කිරීම කාගේත් අපේක්ෂාව විය.

මේ අතර මා හමුවීමට රාජ්‍ය නොවන සංවිධානයක කෙනෙක් ආවේ මුල් කාලයේදීමයි. මා ඉදිරියේ සිතියමක් දිග හැර ගෙන ඔහු මට යුද්ධයේ අවසාන අදියරේ මෙහි සිදු වන දේ විස්තර කළේය. අපේ තානාපති එවන සියලුම කේබල් පණිවුඩ කියවුවත්. පුවත්පත් වලින් හා බුද්ධි අංශවලින් තොරතුරු ලැබුණත් මට එහි මානුෂීය පැත්ත අවබෝධ වූයේ මේ තැනැත්තාගේ විස්තරයෙන් පසුවයි. මෙය සිදු වුයේ අප බලයට පැමිණි මුල් කාලයේ නිසා අපට කළ යුතු දේ ගැන පැහැදිලි අවබෝධයක් තිබුණේ නැත. නමුත් රාජ්‍ය නොවන සංවිධාන වලින් ඇති කළ පීඩනය නිසා මේ අනාරක්ෂිත මිනිසුන් වෙනුවෙන් අපට කළ හැක්කේ කුමක්දැයි සිතීමට සිදුවිය.

මගේ ජීවන ගමන් මග, යම් කිසි පුද්ගලයෙක් ඔහුගේ කාලය ගත කළ යුතු ආකාරය දක්වන ඩාවිනීය ස්වභාවික වරණ ක්‍රියාවලියට අනුව සිදුවූවක් නොවන බව සඳහන් කිරීමට කැමතියි. සිවිල් සමාජයේ හා නිදහස් මාධ්‍යවල නිර්භීතකම හා මෙන්ම පරීක්ෂාවන්හි වැදගත්කම රජයේ සිටින විට අපි සිහියේ තබා ගත යුතු වෙමු.

අපි කිසියම් ව්‍යාපාරයක හෝ මෙහෙයුමක නිරත වන විට ජනතාව හමු වෙමින් ඔවුන්ගේ කථාවලට සවන් දෙමින් සිටියත් රජය ඇතුලේ සිටින විට ඔවුන්ගෙන් ඈත්වෙමු. මේ නිසා පිටස්තර අදහස් වලට සවන් දීමටත්, අපි අකමැති විවේචනවලට කන් දීමටත් පරීක්ෂණ හා තහංචි ක්‍රියාත්මක වන බව තහවුරු කිරීමටත් මං සොයා ගත යුතු වේ. ලුවී බ්‍රැන්ඩීස් හා ජනාධිපති ඔබාමා සඳහන් කර ඇති පරිදි පුරවැසියාගේ තනතුර හා සිවිල් සමාජ නායකයාගේ තනතුර ඉතා වැදගත් වේ. මිහිපිට ඇති වෙන කිසිම රටකට වඩා ක්‍රියාකාරී වෙමින් මේ රටේ සිවිල් සමාජය කිසි දාක සටන අත්හැරියේ නැත. ප්‍රජාතන්ත්‍රවාදී හා වගකියන රජයක් බිහි කිරීමට ඔවුන් පියවර ගත් අතර දැන් එය ශක්තිමත් කිරීමේ අවස්ථාව ඔවුන්ට ලැබී තිබේ.

මගේ රජයේ ජීවිතයද එතරම් වෙනස් නැත. රාජ්‍ය තාන්ත්‍රිකයෙක් වීම නිසා මට කරදර විශාල ප්‍රමාණයකට මුහුණ දීමට සිදුවී තිබේ. එය මගේ ප්‍රබල හැකියාවක්ද

නොවේ. නමුත් මගේ කණ්ඩායම සෑදී ඇත්තේ "හියුමන් රයිටස් වොච්" වැනි සංවිධානවල වැඩ කළ අයගෙන් හා කලින් මාධ්‍යවේදීන් ලෙස කටයුතු කළ අය ගෙනි. මේ නිසා එකම ආකාරයේ අත්දැකීම් ඇති අය නොව නිලධාරීන්ගේ හොඳ සංකලනයක් සමග කටයුතු කිරීමට මට අවස්ථාව ලැබී තිබේ. අන්තර් වාර්ගික විවිධත්වය හා අන්තර් ආගමික විවිධත්වය මෙන් මෙම විවිධත්වයද මිනිසුන්ට උපකාර කළ හැකි ආකාරය ගැන නිර්මාණාත්මකව සිතා ගැටලු විසඳීමට බෙහෙවින් ප්‍රයෝජනවත් වේ.

මගේ සියලුම රැකියාවන්හිදී මා කොතනක සිටියත් මා පෙළඹවූයේ අන් අයට උපකාරී වීමට මට කළ හැක්කේ කුමක්ද යන සිතුවිල්ලයි. මාධ්‍යවේදිනියක් ලෙස මා හැමවිටම සිතුවේ මා යම් කෙනෙක් ගැන ලියන කථාව කියවන රජයේ නිලධාරියෙකුගේ සිත කම්පාවට පත්වී ඒ පුද්ගලයාට පිහිට වනු ඇති බවයි. නමුත් දැන්, කළ යුත්තේ කුමක්දැයි තීරණය කළ යුතු තැනැත්තා වී ඇත්තේ මමයි. රජයේ හෝ පුද්ගලික අංශයේ පවා රැකියාවක නිරත වන ඕනෑම කෙනෙකුට මා කියා සිටින්නේ මේ මහත්මයා යෝජනා කළ දේ කරන ලෙසයි. එනම් අපේ කාලයේ ප්‍රශ්නවල වියුක්ත බවින් ඔබ්බට ගොස් ඒවා අත්දකින පුද්ගලයන් හමු වන ලෙසයි. ඒ මන්ද යත් ඒ ආකාරයට ගැටලු විසඳීම ඉතා දුෂ්කර වන බැවිනි. හඬක් නැතැයි සිතෙන විට, කලකිරීමට පත්වූ විට හෝ ඔබේ කටයුතුවල බලපෑමක් නැතැයි සිතෙන විට ඔබ ඉදිරියට ගෙන යන එකම දෙය පීඩාවට පත් මිනිසුන් හමුවීමයි. එහි කිසියම් පූජනීය බවක් ඇතැයි ඔබට හැඟී යන අතර එහි වගකීමක්ද තිබේ.

මට සෑම විටම මානව හිමිකම් සම්බන්ධයෙන් කටයුතු කිරීමට හැකිවූ බැවින් මම වාසනාවන්තයයි සිතමි. කුරිරු ක්‍රියා වැළැක්වීමට හා සිවිල් ජනතාව ආරක්ෂා කිරීමට අපේ රටවල් උත්සාහ ගනිතැයි මම සිතමි. මට මෙය ඉතා පහසු විය. යුද වාර්තාකාරිනියක්වූ මට අවශ්‍ය නම් ඒ ස්ථානවලින් ඉවත් විය හැකිව තිබුණි. ඒ ප්‍රහාරයට ලක් වන්නේ මගේ පවුල හෝ බෝම්බ වැටෙන්නේ මගේ නිවසට හෝ නොවන බැවිනි. මේ නිසා මා ආශීර්වාද ලත් කෙනෙකැයි මට සිතේ. ඒ නිසා මට ලැබුණු දේ මට හැකි පමණින් ආපසු ලබා දීම සඳහා මගේ රැකියාව යොදා ගැනීමේ වගකීමත් මට පැවරී තිබේ.

**මෙහෙයවන්නා:** තානාපතිනියනි, ඔබට ස්තුතියි. ඔබ මෙහි පැමිණීම ගැන අපි ඉතා සතුටුයි.

**තානාපතිනි පවර්:** ඔබටත් බෙහෝම ස්තූතියි.